සියලු හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# පසුගිය ශිෂ්‍යත්ව විභාග ප්‍රශ්න පත්‍රය 2024

5

"ශිෂ්‍යත්වයට පෙර සූදානමක්"

පහන ONLINE තක්සලාව

## EXAMINATION FOR GRADES FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES 2024

## පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රධානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැක්වෙන විභාගය 2024

**පැය එකයි**

**1 පත්‍රය**

**විභාග අංකය : ..........................................**

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- ඔබට ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40**ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට **තිත් ඉර මත** පිළිතුරු ලියන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරින් **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- කටු වැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| **එකතුව ඉලක්කමෙන්** | |
| **එකතුව අකුරෙන්** | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර ඇගැයීම් කළ බව සහතික කරමි. | <br>V/II/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගැයීම් නිවැරදි බව සහතික කරමි. | <br>V/II/S |
| **ඇගැයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගැයීම් කර ප්‍රධානය කළ ලකුණු නිවැරදි බව තහවුරු කරමි. | <br>V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදිය. | <br>V/II/S/CH |

1. පහත රූප පිළිබඳව සඳහන් කර ඇති නිවැරදිම ප්‍රකාශය කුමක් ද?



A රූපය




B රූපය

(1) A රූපයේ අහස ඇඳ ඇති ආකාරයටම B රූපයේ ද අහස ඇඳ ඇත.

(2) A රූපයේ දක්නට ඇති මල් එලෙසම B රූපයේ ද දක්නට ඇත.

(3) A රූපයේ ඇති සතුන් ගණනට වඩා B රූපයේ ඇති සතුන් ගණන වැඩි ය.

2. පහත ඇති ශාක පත්‍රවල රූප ඒවායේ හැඩය සහ විශාලත්වය අනුව ගොඩවල්වලට වෙන් කළ හොත් ලැබෙන ගොඩවල් ගණන කීය ද ?



(1) 4 (2) 5 (3) 6

3. පහත වාක්‍යයෙහි තද කළු අකුරින් ඇති වචන වෙනුවට පිළිවෙළින් යොදාගත හැකි වචන කට්ටලය කුමක් ද ?

**හිමිදිරි පාන්දරම** අවදිව **මැලිකම් දුරලා** මුහුණ කට සෝදා පිරිසිදු වී සුදු ඇඳුමින් සැරසී පාසල වෙත **පියනගන** සිසු දරුවන් දැක්ම ප්‍රිය දසුනකි.

(1) අලුයම ලහිලහියේ දුවන
(2) උදයේම කම්මැලිව යන
(3) අලුයම කඩිසරව ගමන් කරන

4. පහත සටහනෙහි හිස්තැන් සඳහා වඩාත් සුදුසු වචන පිළිවෙළින් ඇතුළත් පිළිතුර කුමක් ද ?

| | | |
|---|---|---|
| ................................. | පොත | පුස්තකාලය |
| රෝගියා | ................................. | ආරෝග්‍ය ශාලාව |
| ශිෂ්‍යයා | දැනුම | ................................. |

(1) ගුරුවරයා රෝගය පංති කාමරය
(2) ශිෂ්‍යයා මුදල් විද්‍යාගාරය
(3) පාඨකයා බෙහෙත් පාසල

5. පහත කවියෙන් කියවෙන්නේ කුමක් ගැන ද?

හෝ හෝ ගාලා හඬ දෙනවා
මුහුදෙන් වෙරළට නැඟ එනවා
වෙරළේ පෙණ පිඬු විසිරෙනවා
යළි ආපසු ඇදිලා යනවා

(1) මුහුදු රළ (2) මුහුදු වෙරළ (3) මුහුදු සුළඟ


6. සිද්ධියක අවස්ථා කිහිපයක් පහත දැක්වේ.


(a) - මස් කෑල්ලක් කටේ තබාගත් තවත් බල්ලකු වතුරේ සිටිනවා යැයි ඌට පෙනුණි.
(b) - අනෙකාගේ මස් කෑල්ල උදුරා ගැනීමට කට ඇරිය විට උගේ මස් කෑල්ල වතුරට වැටුණි.
(c) - මස් කෑල්ලක් කටින් ගත් බල්ලෙක් ඒදණ්ඩක ගමන් කළේ ය.
(d) - කෑදර බල්ලාට තමා සතුව තිබුණු මස් කෑල්ලත් අහිමි විය.
(e) - ඒ බල්ලාගේ මස් කෑල්ල උදුරා ගැනීමට ඌ සිතුවේ ය.

ඒවායේ නිවැරදි පෙළගැස්ම කුමක් ද ?

(1) c a d e b (2) c a e b d (3) a c e b d


7. පහත සඳහන් රූප රටාවේ ? ඇති කොටුවට ආ යුතු රූපය කුමක් ද ?




(1) (2) (3)


8. පහත කොටුව තුළ ඇති දෑ වඩාත් අර්ථවත්ව පෙන්වා ඇති සටහන කුමක් ද ?





(1) (2) (3)


9. පහත රූපයෙහි පෙන්වා ඇති පෙට්ටිය කපා දිග හැරිය පසු දැකිය හැකි ආකාරය පෙන්වන රූපය කුමක් ද ?






(1) (2) (3)


10. පහත රූපයෙන් දක්වා ඇති ඝන වස්තුව එහි ඇති කඩ ඉර දිගේ කපා සමාන කොටස් දෙකකට වෙන් කළ හොත් ලැබෙන කැපුම් මුහුණතේ හැඩය කුමක් ද?





(1) (2) (3)

11. පහත දක්වා ඇති හිඩැස් පත සහ A, B, C රූප තුන බලන්න.



හිඩැස් පත A B C

එම හිඩැස් පත විවිධාකාරව භාවිත කර

(1) A, B හා C රූප තුනම ඇඳිය හැකි ය.
(2) A හා B රූප දෙක පමණක් ඇඳිය හැකි ය.
(3) A, B හා C යන එකදු රූපයක්වත් ඇඳිය නොහැකි ය.

12. ෆාතිමා, මිෂෙල්, කවීෂ සහ රාමන් යනු ළමයි සිව්දෙනෙකි. මිෂෙල් ෆාතිමාට වඩා වැඩිමහල් වන අතර කවීෂට වඩා බාල ය. රාමන් මිෂෙල්ට වඩා බාල වන අතර ෆාතිමාට වඩා වැඩිමහල් ය. මේ අනුව වැඩිමහල්ම ළමයාත් බාලම ළමයාත් පිළිවෙළින්

(1) මිෂෙල් සහ රාමන් වේ. (2) කවීෂ සහ ෆාතිමා වේ. (3) කවීෂ සහ රාමන් වේ.

13. පෙරේදාට පෙර දවස සිකුරාදා නම් අනිද්දාට පසු දවස කවදා ද ?

(1) අඟහරුවාදා (2) බදාදා (3) බ්‍රහස්පතින්දා

14. සමාන යන්ත්‍ර 5කින් මිනිත්තු 5ක් තුළ බෝනික්කන් 5ක් නිපදවිය හැකිය. ඒ අනුව එවැනිම යන්ත්‍ර100කින් බෝනික්කන් 100ක් නිපදවීමට ගතවන කාලය කොපමණ ද ?

(1) මිනිත්තු 5 (2) මිනිත්තු 20 (3) මිනිත්තු 100

15. ගීතා රුපියල් 20කට පැරණි මුද්දර කිහිපයක් මිලට ගෙන, එදිනම එම මුද්දර රාණිට රුපියල් 40කට වික්කාය. පසු දින රාණිගෙන් රුපියල් 60කට එම මුද්දර සියල්ල නැවත මිලට ගත්තාය. ඉන්පසු එම මුද්දර රුපියල් 50කට වික්කේ නම්, මෙම ගනුදෙනුවේදී ගීතාට

(1) ලාභයක් සිදුවේ.
(2) අලාභයක් සිදුවේ.
(3) ලාභයක් හෝ අලාභයක් හෝ සිදු නොවේ.

16. දිනපතා උදෑසන කාලගුණ අනාවැකියට සවන්දෙන සිරිපාල මහතා තම මෝටර් රියෙන් කාර්යාලයට යන්නේ වැසි දිනවලදී පමණි. සෑම වැසි දිනකදීම ඔහු නොවරදවාම කුඩයක් රැගෙන යයි. ඒ අනුව පහත දී ඇති කුමන ප්‍රකාශය නිවැරදි ද ?

(1) සිරිපාල මහතා කුඩයක් රැගෙන කාර්යාලයට යන සෑම දිනකම තම මෝටර් රියෙන් යයි.
(2) සිරිපාල මහතා තම මෝටර් රියෙන් කාර්යාලයට යන සමහර දිනවල කුඩයක් රැගෙන නොයයි.
(3) සිරිපාල මහතා තම මෝටර් රියෙන් කාර්යාලයට යන සෑම දිනකම කුඩයක් රැගෙන යයි.

17. සෙන්ටිමීටර 20ක් උස බෝතලයක් තුළ සෙන්ටිමීටර 8ක් උසට ජලය ඇත. මෙම ජල ප්‍රමාණය බෝතලයේ අල්ලන මුළු ජල ප්‍රමාණයෙන් හරි අඩකි. ජලය පිටතට නොයන සේ මූඩිය වසා බෝතලය යටිකුරු කළ විට ජල මට්ටමේ උස සෙන්ටිමීටර කොපමණ ද ?

(1) 8 (2) 10 (3) 12


ඉනෝකා ටීචර් 077 90 29 607 - පහන ONLINE තක්සලාව

24. සිරස් බිත්තියක රඳවා ඇති බිත්ති ඔරලෝසුවක වේලාව 9.00 වන විට එහි පැය කටුව නැගෙනහිර දිශාවට යොමු වෙයි. මෙම ඔරලෝසුවට හරි කෙළින් ඉදිරියෙන් සිටගෙන වේලාව බලන අයෙකු මුහුණ ලා සිටින්නේ කුමන දිශාවට ද?

(1) උතුරට (2) බස්නාහිරට (3) දකුණට

25. එකම දිනකදී පෙරවරු 6.00 සිට පස්වරු 6.00තෙක් කාලය තුළ ඔරලෝසුවක පැය කටුව මතින් මිනිත්තු කටුව කී වරක් ගමන් කරයි ද?

(1) 10 (2) 11 (3) 12

26. ශිෂ්‍යයෙකු ළඟ රුපියල් දහයේ කාසියක්, රුපියල් පහේ කාසියක් සහ රුපියල් දෙකේ කාසියක් පමණක් තිබේ. මෙම කාසිවලින් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ යොදාගෙන, එම ශිෂ්‍යයාට එකිනෙකට වෙනස් මුදල් ප්‍රමාණ කීයක් ඉදිරිපත් කළ හැකි ද ?

(1) 4 (2) 7 (3) 9

27. A කඩදාසි පටිය මත B කඩදාසි පටිය කවර ආකාරයෙන් තැබුව ද දැකිය **නොහැකි** අවස්ථාවක් වන්නේ කුමක් ද ?

| △ | ✤ | □ | ○ |
|---|---|---|---|

A කඩදාසි පටිය

| △ | ✳ |
|---|---|

B කඩදාසි පටිය

(1) | ○ | △ | ✳ | ▽ | (2) | ○ | □ | ✳ | ▽ | (3) | ✳ | △ | ✤ | ▽ |

28. A,B,C යනු සමාන ජල ප්‍රමාණ අඩංගු භාජන තුනකි. පහත දී ඇති පියවර තුන අනුපිළිවෙළින් සලකා බලන්න.

- A භාජනයේ ඇති ජලයෙන් හරි අඩක් B භාජනයට දැමීම.
- ඊළඟට B භාජනයේ ඇති ජලයෙන් හරි අඩක් C භාජනයට දැමීම.
- අනතුරුව C භාජනයේ ඇති ජලයෙන් හරි අඩක් A භාජනයට දැමීම.

දැන් එක් එක් භාජනයේ අඩංගු ජල ප්‍රමාණ අනුව ඒවායේ ආරෝහණ පටිපාටිය කුමක් ද?

(1) A,B,C (2) B,C,A (3) C,A,B

29. වාක්‍ය කොටස් තුනක් සහ ඒවා සංකේතාත්මකව දැක්වෙන ප්‍රකාශ තුනක් පහත දැක්වේ.

| □ ○ ◇ | පාට මල් සුවඳයි | හරි ලස්සන පාට |
|---|---|---|
| රෝස පාට මල් | ◇ △ ✡ | ⊙ ◇ △ |

ඒ අනුව ''රෝස මල් හරි සුවඳයි'' යන වාක්‍යය සංකේතාත්මකව දැක්වෙන ප්‍රකාශය කුමක් ද?

(1) ⊙ ◇ △ ✡ (2) ⊙ △ □ ✡ (3) □ ○ ⊙ △

30. චතුස්තලයක මුහුණත් හතරෙහි එක් මුහුණතක එක් ඉලක්කම බැගින් 1,2,3,4 යන ඉලක්කම් ලියා තිබේ. මෙලෙස ඉලක්කම් ලියා ඇති චතුස්තල දෙකක් මේසයක් මත තබා ඇති විට, මේසයට ස්පර්ශ නොවූ මුහුණත්වල ඇති ඉලක්කම්වල එකතුව 15කි. මේසය සමඟ ස්පර්ශව ඇති මුහුණත් දෙකෙහි ඇති ඉලක්කම්වල එකතුව කීය ද?

(1) 3 (2) 5 (3) 7

18. මාසයක ඉරිදා දිනවල එකතුවට තිබිය හැකි උපරිම අගය වන්නේ,

(1) 80 (2) 85 (3) 88


19. පහත දැක්වෙන්නේ දරුවෙකු තම මවගෙන් කරනු ලබන විමසීමකි.

''මට නොදැනෙන්නේ මා කණ කොලුවෙකි ලු කුඩා
ලොකු වෙනකොට දැනේවි ද මම අසමි හඬා''

මෙම දරුවා විමසන පරිදි ඔහුට නොදැනෙන්නේ කුමක් නිසා ද ?


(1) අන්ධ නිසා (2) කොලුවෙකු නිසා (3) කුඩා නිසා


20. පහත දැක්වෙන්නේ ගමක දළ සැලැස්මකි. ඒ පිළිබඳව කර ඇති ප්‍රකාශ අතුරෙන් **වැරදි** ප්‍රකාශය කුමක් ද ?





(1) බෙහෙත් ශාලාවට වඩා උස්බිමක පන්සල පිහිටා ඇත.
(2) ක්‍රීඩාපිටියට උතුරින් වැව පිහිටියේ නම් පාසලට බටහිරින් බෙහෙත් ශාලාව පිහිටා ඇත.
(3) තැපැල් කාර්යාලයේ සිට පන්සලට යන විට වැව් බැම්ම මතින්ම යා යුතු ය.

21. A සහ B කොටස් දෙක එකතු කර සෑදිය හැකි ඝන වස්තුවක හැඩය දැක්වෙන රූපය කුමක් ද ?


A B


(1) (2) (3)

22. මිදුලක ඇඳ ඇති සමචතුරස්‍රයක් රූපයේ දැක්වේ. එහි 'උතුරු' දිශාව ද ලකුණු කර ඇත. A,B,C,D යන ස්ථාන හතරෙහි සිටගෙන සිටින ළමයින් සිවුදෙනෙකු අතුරෙන්, A හි සිටින ළමයාත් C හි සිටින ළමයාත් නැගෙනහිර දිශාවට ද B හි සිටින ළමයාත් D හි සිටින ළමයාත් බස්නාහිර දිශාවට ද මුහුණ ලා සිටිති. මේ අය අතුරෙන් මුහුණට මුහුණ ලා සිටින දෙදෙනා සිටින ස්ථාන දෙක මොනවා ද?





(1) A සහ B (2) B සහ C (3) C සහ D


23. සරත් තම නිවසේ සිට දුම්රියපළට යතුරු පැදියෙන් යන්නේ ඒකාකාර (නොවෙනස් වන) වේගයකිනි. ගමන අරඹා පළමුවන මිනිත්තු 10 ගතවන විට ඔහු ගමන් කර තිබූ දුර මෙන් දෙගුණයක දුරක් යාමට ඉතිරිව තිබුණි. ඔහු ගමන් කර ඇති දුරත් ඔහුට යාමට ඉතිරිව ඇති දුරත් සමාන වන්නේ තව කොපමණ කාලයක් ගමන් කිරීමෙන් පසුව ද?

(1) මිනිත්තු 5 ක් (2) මිනිත්තු 10 ක් (3) මිනිත්තු 15 ක්

31. පහත A රූපයේ දැක්වෙන්නේ ළමයින් 12 දෙනෙකුට වැඩි සංඛ්‍යාවක් පෙළට සිටගෙන සිටින ආකාරයයි. ඔවුහු B රූපයේ දැක්වෙන පරිදි 1 වෙනියා මැද සිටින ආකාරයට 2වෙනියා 1 වෙනියාගේ වම් පැත්තේ ද, 3 වෙනියා 1 වෙනියාගේ දකුණු පැත්තේ ද, 4 වෙනියා 2 වෙනියාගේ වම් පැත්තේ ද, ආදී වශයෙන් මාරුවෙන් මාරුවට සිට ගනිති.




A රූපය





B රූපය


එසේ සිට ගත් විට 10 වෙනියා දෙපස සිටින්නේ කවුරුන් ද?

(1) 8 වෙනියා සහ 9 වෙනියා (2) 9 වෙනියා සහ 11 වෙනියා (3) 8 වෙනියා සහ 12 වෙනියා

32. පහත ඇත්තේ ගේට්ටුවක ඉදිරිපස සිට බලන විට එය පෙනෙන ආකාරයයි.



එහි පිටුපස සිට බලන විට ගේට්ටුව පෙනෙන ආකාරය පෙන්වන රූපය කුමක් ද?



(1) (2) (3)

33. සෘජුකෝණාස්‍රාකාර ඉඩමක් මුළුමනින්ම ආවරණය වන පරිදිත් යාබද පේළි දෙකක් අතරත් යාබද තීර දෙකක් අතරත් පරතරය 3m ක් බැගින් වන පරිදිත් ඉඩමේ පැළ 35ක් සිටුවා ඇත. එම පැළ සිටුවා ඇති සීමාවේ සිට ඉඩමේ මායිම තෙක් 2m ක් පළල පාරක් ද ඉඩම වටේටම ඇත. ඉඩමේ පළල කොපමණ ද ?

(1) 14m (2) 16m (3) 19m

34. එක්තරා දිනක යහළුවන් තිදෙනෙකු කළ ප්‍රකාශ පහත දැක්වේ.

තුසිත් : අද තුශාන්ගේ උපන් දිනයයි.
තුශාන් : නැහැ අද දෙව්මිගේ උපන් දිනයයි.
දෙව්මි : තුශාන්ගේ ප්‍රකාශය වැරදියි.


මේවායින් එක් අයෙකුගේ ප්‍රකාශයක් පමණක් වැරදි නම් හා තිදෙනාගෙන් එක් අයෙකුගේ පමණක් උපන් දිනය එදිනට යෙදී ඇත්නම් ඒ කාගෙ ද ?

(1) තුසිත්ගේ (2) දෙව්මිගේ (3) තුශාන්ගේ

35. ළමයින් 43දෙනෙකු සිටින පන්තියක ගැහැණු ළමයින් 7 දෙනා බැගින් ද, පිරිමි ළමයි 5 දෙනා බැගින් ද, වෙන් වෙන්ව කණ්ඩායම්ගත කළ විට පන්තියේ සියලුම ළමයින් කණ්ඩායම්ගත වේ නම් ගැහැණු ළමයින්ගේ කණ්ඩායම් කීයක් තිබේ ද?


(1) 2 (2) 3 (3) 4

36. වැඩිම ප්‍රදේශයක් අඳුරු කර ඇති රූපය කුමක් ද?



(1) (2) (3)

37. ළමයින් නව දෙනෙකු එකිනෙකාගේ අත් අල්ලා ගෙන පේළියට සිටින අවස්ථාවක තිදෙනා බැගින් වන සේ ගත් රූප රාමු හතරක් පහත දැක්වේ.




A B C D

ළමයින් නව දෙනාම සිටින පේළිය ලැබෙන සේ රූප රාමු තැබිය යුතු අනුපිළිවෙළ කුමක් ද?


(1) A B C D (2) B D A C (3) D B C A

38. රූපයේ දැක්වෙන පරිදි සම්පූර්ණයෙන් ජලය පුරවා ඇති A භාජනයෙන් කිසියම් ජල ප්‍රමාණයක්, හිස්ව තිබෙන B භාජනයට දමන ලදී. එවිට එක් එක් භාජනයෙහි $\frac{3}{4}$ ක් බැගින් පිරී තිබෙන පරිදි ජලය අඩංගු විය. මෙසේ වීමට A භාජනයෙහි අල්ලන ජලය ප්‍රමාණය B භාජනයෙහි අල්ලන ජලය ප්‍රමාණය මෙන් කී ගුණයක් විය යුතු ද ?




(1) දෙගුණයක් (2) තුන් ගුණයක් (3) හතර ගුණයක්


39. P හි ඇති තැටි සියල්ල වරකට එක බැගින් ගනිමින් Q සහ R භාජනවලට රූපයේ පරිදි දැමිය යුතු ය. එසේ දැමීමේදී P ගෙන් ඉවතට ගන්නා තැටියක් Q භාජනයට හෝ R භාජනයට හෝ දැමීමෙන් පසු පමණක් ඊළඟ තැටිය P ගෙන් ඉවතට ගත යුතු ය.




මෙම ක්‍රියාවලියේදී එක් එක් භාජනයට තැටි දමන විට පියන විවෘතව තැබිය යුත්තේ එම භාජනයේ පමණි. ඒ අනුව භාජන දෙකෙහි පියන් විවෘත කළ යුතු **අවම** වාර ගණන කීය ද ?

(1) 4 (2) 5 (3) 8

40. පහත රූපයේ දැක්වෙන්නේ A,B,M සහ N යන නගර හතරක් සහ එම නගර අතර බස් ධාවනයට ගත වන කාලයයි.




ඕනෑම බස් රථයකට A හෝ B හෝ නගරවලින් පිටත් විය හැක්කේ පෙ.ව 9.00, 9.30, 10.00, 10.30 ආදී ලෙස මිනිත්තු 30කට වරක් ය. M නගරයෙන් පෙ.ව 09.05ට පිටත්වූ බස් රථයකින් ගමන ආරම්භ කර N නගරය වෙත පෙ.ව 10.40ට පැමිණි මගියෙකු ගමන් කර ඇති මාර්ගයක් විය හැක්කේ කුමක් ද ?

(1) M→ B→ A→ N (2) M →A →B→ N (3) M→B →N

**පිළිතුරු සාකච්ඡාව pahana Online Thaksalawa youtube නාලිකාවෙන් නරඹන්න.**

සියලු හිමිකම් ඇවිරිණි
All Rights Reserved

පහන ONLINE තක්සලාව

# පසුගිය ශිෂ්‍යත්ව විභාග ප්‍රශ්න පත්‍රය 2024

5

"ශිෂ්‍යත්වයට පෙර සූදානමක්"

## EXAMINATION FOR GRADES FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES 2024

**පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රධානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැක්වෙන විභාගය 2024**

**පැය 1 මිනිත්තු 15**

**II පත්‍රය**

**විභාග අංකය : ...........................................**

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60**ක් ඇත. සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.
- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට **තිත් ඉර මත** පිළිතුරු ලියන්න.
- පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.
- කටු වැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| **එකතුව ඉලක්කමෙන්** | |
| **එකතුව අකුරෙන්** | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර ඇගැයීම් කළ බව සහතික කරමි. | V/II/S |
| **දෙවන පරීක්ෂක** පළමු පරීක්ෂක කර ඇති ඇගැයීම් නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| **ඇගැයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගැයීම් කර ප්‍රධානය කළ ලකුණු නිවැරදි බව තහවුරු කරමි. | V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදිය. | V/II/S/CH |

**1.** පහත දැක්වෙන ඡේදය කියවන්න.

ගැමුණු විද්‍යාලයේ සෑම වර්ෂයක ම පැවැත්වෙන ප්‍රදර්ශනය මෙවර ද ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී. පාසලේ ප්‍රාථමික අංශයේ සෑම දෙනාගේ ම සහභාගිත්වයෙන් මෙම ප්‍රදර්ශනය පැවැත්වූ අතර එහි සංවිධාන කටයුතු පහ ශ්‍රේණියේ සිසුන්ට භාර දී තිබුණි. ප්‍රදර්ශනය නැරඹීම සඳහා පැමිණෙන ලෙස දෙමාපියන්ට මෙන් ම අසල්වාසී පාසල්වල ගුරුවරුන්ට සහ සිසුන්ට ද ආරාධනා කර තිබුණි.

ප්‍රදර්ශන භාණ්ඩ අලංකාර නිමාවකින් යුතුව සකස් කර තිබීම සැමගේ ම සිත් ඇඳ බැඳ තබාගන්නා කරුණක් විය. ප්‍රදර්ශනයේ දී කාගේත් වැඩි අවධානයක් යොමු වූයේ දිමුත් සහ ඔහුගේ මිතුරා වන ප්‍රගීත් විසින් සාදන ලද 'රොබෝ' වෙතයි. දෙදෙනා විසින් ඉදිරිපත් කරන ලද එම නිර්මාණය සඳහා ප්‍රථම ස්ථානය හිමිව තිබුණි. පසුදින පවත්වන ලද උදෑසන රැස්වීමේ දී විදුහල්පතිතුමා ප්‍රදර්ශනය සංවිධානය, සහභාගිත්වය සහ ජයග්‍රහණ අගය කරමින් කතාවක් පවත්වන ලදී. රැස්වීමේ අවසානය, ජයග්‍රහණ සහ සහභාගිත්වය සඳහා සහතික පත්‍ර පිරිනැමීමේ අවස්ථාව විය. තම නිර්මාණය සඳහා ප්‍රථම ස්ථානය ලැබීම හේතුවෙන් දෙදෙනාට ම එම ප්‍රදර්ශනය ජීවිතයේ අමතක නොවන්නක් විය.

- **ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

(i) ප්‍රදර්ශනය පවත්වන ලද්දේ කුමන විද්‍යාලයේ ද ?

.......................................................................................................................

(ii) ප්‍රදර්ශනය සංවිධාන කටයුතු භාර දී තිබුණේ කාට ද ?

.......................................................................................................................

(iii) දිමුත් සහ ප්‍රගීත් නිර්මාණය කරන ලද්දේ කුමක් ද ?

.......................................................................................................................

(iv) ප්‍රදර්ශනය නැරඹීම සඳහා ආරාධනා ලැබුවේ කවුරුන් ද ?

.......................................................................................................................

(v) ප්‍රදර්ශනය, දිමුත් සහ ප්‍රගීත්ට අමතක නොවන්නක් වූයේ කුමක් නිසා ද ?

.......................................................................................................................

(vi) 'ආරම්භය' යන්නට විරුද්ධ පදයක් මෙම ඡේදයේ සඳහන් වේ. එය කුමක් ද ?

.......................................................................................................................

(vii) පසුදින පවත්වන ලද උදෑසන රැස්වීමේ දී විදුහල්පතිතුමා අගය කළේ මොනවා ද ?

.......................................................................................................................

**2.** පහත සඳහන් එක් එක් වගන්තියට ගැලපෙන නිවැරදි ආඛ්‍යාත පදය වරහන් තුළින් තෝරා **යටින් ඉරක් අඳින්න.**

(i) සමනලයා මලින් මලට ගොස් මල් පැණි ........................................(බොයි / බොති)

(ii) ධීවරයෝ උදෑසනින් ම මුහුදු ........................................................(යයි / යති)

(iii) පසුගිය සමිති වාර්තාව ලේකම් ඉදිරිපත් ......................................(කළේය / කළහ)

(iv) නන්දනී, තාරුක සහ නිර්මාල් පුස්තකාලයට ..................................(ගියෝ ය / ගියේ ය)

(v) වදනි සංගීතයට අනුව තාලයට ....................................................(නැටුවේ ය / නැටුවා ය)

**විභාග අංකය : ..........................................**

**3.** පහත සඳහන් වාක්‍ය වර්තමාන කාලයට හරවා ලියන්න.

(i) මේනකා ක්‍රීඩා පුහුණුවීම් කළා ය.

..........................................................................................................................................

(ii) සංජීව පරිසරය පිළිබඳ ප්‍රශ්න ඇසුවේ ය.

..........................................................................................................................................

**4.** පහත සඳහන් එක් එක් වගන්තියේ වැරදි අක්ෂර සහිත වචන **දෙක** බැගින් ඇත. එම වචන පමණක් නිවැරදි කරමින් අදාළ තිත් ඉර මත ලියන්න.

(i) පෘථිවි පෘෂ්ටය මත විවිද වෘක්ෂලතා වැඩෙයි.

.......................................................... ..........................................................

(ii) දේශගුණය පිළිබඳ පවත්වන දේශණය සඳහා සැමදෙනා ම සහභාගී වන්න.

.......................................................... ..........................................................

**5.** පහත වචන නිවැරදි ගළපා වගන්ති නැවත ලියන්න.

(i) දැනුම් / පැමිණෙන / දෙන්න / ලෙස / පුස්තකාලයට / සිසුන්ට

..........................................................................................................................................

(ii) ගල / ඉවතට / තල්ලු / මිනිස්සු / කළහ / දරා / උත්සාහයක්

..........................................................................................................................................

**6.** පහත සඳහන් වාක්‍ය ලිඛිත භාෂාවට හරවා ලියන්න.

(i) මම පාසල් යාමට ඇලුම් කරනවා.

..........................................................................................................................................

(ii) අපි කතන්දර පොත් කියවනවා.

..........................................................................................................................................

**7.** පහත දැක්වෙන වගන්තියෙහි අදාල ස්ථානවල විරාම ලකුණු යොදන්න.


| |
|---|
| අපි ගොවිපළක් නැරඹීමට යමු යැයි ගුරුතුමිය යෝජනා කළා ය |

**8.** යුගල පද සම්පූර්ණ කරන්න.


(i) ගමන් ..................................................  (ii) සෙල්ලම් ..............................................

**9.** 'යහළුවා' යන වචනයෙහි ස්ත්‍රී ලිංග පදය ලියන්න. ........................................................................

**10.** එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ **ඉංග්‍රීසි** අකුරෙන් ම ලියන්න.



| | | | | |
|---|---|---|---|---|
| | | | | |



| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |

**11.** පහත දී ඇති වචන නිවැරදි ව ගලපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(i) am / book / a / reading / I : ........................................................

(ii) go / everyday / to / We / school : ........................................................

**12.** එක් එක් ඉංග්‍රීසි වචනයෙහි අර්ථය සිංහලෙන් ලියන්න.

(i) Airport : ........................................................ (ii) Bottle : ........................................................

**13.** 'මුහම්'(முகம்) යන දෙමළ වචනය සඳහා යෙදෙන **සිංහල** වචනය ලියන්න.

..........................................................................................................................................

**14.** පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය **සිංහලෙන්** ලියන්න.

ඔබේ වයස කීයද?..........................................................................................................................


**15.** පහත සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

විසි දහස් හයසිය තිහ : ..............................................................................................................

**16.** 5438 සංඛ්‍යාවේ 4 ඉලක්කම පිහිටි ස්ථානය සහ 4 ඉලක්කමෙන් නිරූපිත අගය ලියන්න.

..........................................................................................................................................................

**17.** සිසුන් කණ්ඩායමක තමා කැමති ම ක්‍රීඩාව පිළිබඳ තොරතුරු පහත ප්‍රස්ථාරයෙන් දැක්වේ.




(i) දැල්පන්දු ක්‍රීඩාවට වඩා ක්‍රිකට් ක්‍රීඩාවට කැමති ම සිසුන් ගණන කොපමණ ද ?

..........................................................................

(ii) මෙහි සඳහන් සිසුන්ට අමතරව පාපන්දු ක්‍රීඩාවට කැමති ම සිසුන් දෙදෙනෙකු ද පන්තියේ සිටිත් නම් පන්තියේ සිටින මුළු සිසුන් ගණන කොපමණ ද ?


..........................................................................

**18.** පහත කොටුව තුළින් සංඛ්‍යා හතරක් තෝරාගෙන පොදු අන්තරය 4 වන සංඛ්‍යා රටාවක් හිස්තැනෙහි ලියන්න.

| | | |
|---|---|---|
| 2 | 10 | 7 |
| 3 | 6 | 14 |

.................., .................., .................., ......................


**19.**




රූපයේ දක්වා ඇති මිනුම් සරාවෙහි ඇති ජල ප්‍රමාණය කොපමණ ද ?

.................................................................................ml

**20.**





තරාදියෙහි ඇති අර්තාපල්වල බර ග්‍රෑම් වලින් කොපමණ ද ?

.................................................................................g

**21.** පහත කොටු ජාලය තුළ කොටු 6ක් දිග, කොටු 3ක් පළල සෘජුකෝණාස්‍ර හැඩයක් අඳින්න.



**22.** පහත රූපයේ පාට කළ ප්‍රමාණය දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.



..............................................................................

**23.** අක්කා බෑගයක් මිලදී ගැනීමට රුපියල් 2500ක් රැගෙන කඩයට ගියා ය. බෑගය මිලදී ගත් පසුව රුපියල් 125ක් ඉතුරු විය. බෑගයේ මිල කීය ද ?

රුපියල් ..................................................................

**24.** පාසල් පුස්තකාලයට ලැබුණු පොත් 420ක් රාක්ක හතරකට සමානව අසුරන ලදී. එක් රාක්කයක අසුරන ලද පොත් ගණන කීය ද ?

..............................................................................

**25.** පොල් වතු දෙකකින් කඩන ලද පොල් ගෙඩි ප්‍රමාණ පිළිවෙළින් 3875ක් සහ 4623කි. එයින් පොල් ගෙඩි 6500ක් විකුණුවේ නම් ඉතුරු වූ පොල් ගෙඩි ගණන කීය ද ?

..............................................................................

**26.** බඳුනක තිබූ පලතුරු බීම සියල්ල එකකට 2*l* 250*ml* බැගින් සමානව බෝතල් 6 කට පුරවන ලදී. බඳුනෙහි තිබූ පලතුරු බීම ප්‍රමාණය කොපමණ ද ?

..............................................................................

**27.** වේදිකා නාට්‍යයක් සඳහා ගත වූ කාලය පැය 2යි මිනිත්තු 15කි. එය අවසන් වූ වේලාව පස්වරු 6.00 නම් නාට්‍යය ආරම්භ කළ වේලාව කීය ද ?

..............................................................................

**28.** මගියෙකු 16 km ක දුරකින් 14 km 50 m ක දුරක් බසයෙන් ද ඉතිරි දුර පයින් ද ගමන් කරන ලදී. ඔහු පයින් ගමන් කල දුර කොපමණ ද ?

..............................................................................

**29.** පරිප්පු 3 kg කින්, 250g බැගින් වූ පරිප්පු මලු කීයක් සැකසිය හැකි ද ?

..............................................................................

- අංක **30** සිට **59** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා **යටින් ඉරක් අඳින්න**.

**30.** ශ්‍රී ලංකාවේ ජාතික ගීය රචනා කරන ලද්දේ කවුරුන් ද ?

(1) එස්. මහින්ද හිමි
(2) ආනන්ද සමරකෝන් මහතා
(3) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතා

**31.** සිසුන් කණ්ඩායමක් අවට පරිසරයේ සිටින සතුන් කිහිපදෙනෙක් නිරීක්ෂණය කර පාද ඇති හෝ පාද නැති හෝ බව අනුව වර්ග කරන ලදී. එවිට එක් වර්ගයකට අයත් සතුන් විය හැක්කේ,

(1) කූඹියා, මකුළුවා හා ගජ්පියා ය.
(2) හැකරැල්ලා, බත්කූරා හා ගැඩවිලා ය.
(3) බල්ලා, ගිරවා හා හූනා ය.

**32.** ශ්‍රී ලංකාවට ආවේණික වූ 'යක් කටුස්සා',

(1) ක්ෂීරපායීන්ට අයත් වේ. (2) උරගයින්ට අයත් වේ. (3) පක්ෂීන්ට අයත් වේ.

**33.** සතුන් හා ශාක **එකිනෙකාට** ප්‍රයෝජනවත් වන ආකාරය **වඩාත් හොඳින්** පැහැදිලි වන ප්‍රකාශය තෝරන්න.

(1) සත්ත්ව මලමුත්‍ර ශාකවලට පොහොර ලෙස දැමීම
(2) ශාක නිසා සමහර සතුන්ට ආරක්ෂාව ලැබීම
(3) සමහර සතුන් ශාක ආහාරය ලෙස ගෙන බීජ තැන තැන දැමීම


**34.** පස සරු කිරීම, අහිතකර කෘමීන් ආහාරයට ගැනීම සහ මල් පරාගනයට උපකාරී වීම යන බෝග වගාවට හිතකර තත්ත්ව ප්‍රධාන වශයෙන් සිදුකරන සත්ත්වයන් වන්නේ පිළිවෙලින්,

(1) ගෙම්බා, කටුස්සා සහ මී මැස්සා ය.
(2) පුරුක් පණුවා, දළඹුවා සහ බඹරා ය.
(3) ගැඩවිලා, බකමූණා සහ සමනලයා ය.

**35.** කොස්, පොල් හා කෙසෙල් යන ශාක තුන පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) ගෘහ භාණ්ඩ තැනීම සඳහා දැව ලබා ගැනීම
(2) සතුන් තම වාසස්ථාන සකසා ගැනීම
(3) ශක්තිමත් මුදුන් මුල් මගින් පසට සවිවීම

**36.** පහත රූපයේ මලක කොටස් දක්වා ඇත. එහි A මඟින් දක්වා ඇත්තේ කුමක් ද?




(1) නටුව
(2) මණි පත්‍ර
(3) රේණු

**37.** දඬු කැබලි මගින් පැළ කරන ශාකවලට උදාහරණයක් වන්නේ,

(1) කංකුං ය. (2) රාබු ය. (3) පතෝල ය.

**38.** වී වගාවෙන් ලැබුණු අස්වැන්න ආරක්ෂා කර ගැනීම සඳහා සිදු **නොකළ** යුතු දේ කුමක් ද?

(1) නියමිත කාලයට වී අස්වැන්න නෙළා ගැනීම
(2) වී අස්වැන්න ගෝනිවලට දමා වියළි ස්ථානයක තැබීම
(3) කෘමි හානි වළක්වා ගැනීම සඳහා රසායන ද්‍රව්‍ය යෙදීම

**39.** විශාල ජලාශවල සකස් කර ඇති වේල්ල පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) වේල්ලේ ඉහල කොටසේ පළල, පාමුලට හා මැද කොටසට වඩා වැඩිය.
(2) වේල්ලේ පාමුල පළල, මැද කොටසට හා ඉහල කොටසට වඩා වැඩිය.
(3) වේල්ලේ මැද කොටසේ පළල, ඉහල කොටසට හා පාමුලට වඩා වැඩිය.

**40.** ගලා යන ජලය මගින් කරකැවිය හැකි ජල රෝදයක් සෑදිය **නොහැක්කේ,**

(1) කෙසෙල් බඩ හා ලී පතුරු මගිනි.
(2) රිජිෆෝම් රවුමක් යෝගට් හැඳි මගිනි.
(3) කජ්පියක් හා ලණු කැබලි මගිනි.

**41.** අතීතයේ දී හේන් සහ කුඹුරු වගාවේ ආරක්ෂාව සම්භන්ධ අවස්ථා තුනක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) දිය හොල්මන, පිටවැට කැපීම, ගිනිමැල ගැසීම
(2) ටකය ගැසීම, දඬු වැට, සෙක්කුව කරකැවීම
(3) අණ බෙර ගැසීම, පඹයන් සිටුවීම, බඹර පෙත්ත

**42.** මුහුදු වෙරළක් **නොමැති** පළාත් දෙකක් සඳහන් පිළිතුර කුමක් ද?

(1) උතුරුමැද හා වයඹ (2) සබරගමුව හා නැගෙනහිර (3) මධ්‍යම හා ඌව

**43.** ඇස් පෙනීම දුර්වල වීමට වඩාත් ම බලපෑමක් ඇති කරන්නේ කුමන විටමින් ඌනතාව ද?

(1) විටමින් A (2) විටමින් B (3) විටමින් C

**44.** සිතියම් වල 'අධිවේගී මාර්ග' සඳහා භාවිත කර ඇති වර්ණය කුමක් ද?

(1) කළු (2) රතු (3) දම්

**45.** මිරිස් පැළයක් වගා කිරීම සඳහා ආහාර අසුරා තිබූ පොලිතින් බෑගයක් යොදා ගැනීම,

(1) ප්‍රතිචක්‍රීකරණයකි. (2) නැවත භාවිත කිරීමකි (3) භාවිතය අවම කිරීමකි

**46.** පුද්ගලයකුගෙන් වෙනත් පුද්ගලයකුට බෝවිය හැකි රෝගය කුමක් ද?

(1) දියවැඩියාව (2) සරම්ප (3) අධි රුධිර පීඩනය

**47.** රූපයේ දැක්වෙන සරල දොඹකරයක් ආකාරයට සකස් කරන ලද ඇටවුමක් මඟින් ඉහලට එසවිය හැකි ද්‍රව්‍යක් වන්නේ,





(1) මකනයයි.
(2) ඇල්පෙනෙත්තයි.
(3) කිරල ඇබයයි.

**48.** අයිස් කැට දිය නොවී වැඩි කාලයක් තබා ගත හැකි අවස්ථාව මින් කුමක් ද?

(1) රිජිෆෝම් පෙට්ටියක දමා වසා තැබීම
(2) ප්ලාස්ටික් භාජනයක තැබීම
(3) වතුර භාජනයක දැමීම

**49.** තෙත පුළුන් මත තබන ලද මෑ බීජයක සිදු වූ වෙනස්වීම රූපයේ දක්වා ඇත.
එහි A ලෙස දැක්වෙන්නේ කුමක් ද?





(1) කඳ (2) පත්‍ර (3) මුල

**50.** තම මව්බසට අමතරව ඉංග්‍රීසි භාෂාව හොඳින් ඉගෙනීම නිසා ලැබෙන වාසියක් වන්නේ,


(1) අන්තර්ජාලයෙන් දැනුම ලබාගැනීමට පහසු වීමයි.
(2) තම මව් භාෂාවෙන් ලියැවී ඇති පොත් කියවීමට පහසු වීමයි.
(3) වෙනත් කිසිදු විදේශීය භාෂාවක් ඉගෙනීමට අවශ්‍ය නොවීමයි.

**51.** රූපයේ දැක්වෙන පරිදි බඳුන් 3කට නිල්, කහ, රතු යන දියසායම් වලින් වර්ණ ජලය සමාන ප්‍රමාණ බැගින් දමා ඇත. එම බඳුන් 3 අතර සුදු ටිෂූ කඩදාසිය බැගින් එක් බඳුනක සිට ඊළඟ බඳුන දක්වා ඇතුළු කර මිනිත්තු 10කට පමණ පසුව ලබාගත් නිරීක්ෂණයක් විය හැක්කේ,




(1) A කඩදාසියේ රතු පැහැයක් දක්නට ලැබීමයි.
(2) B කඩදාසියේ කහ පැහැයක් දක්නට ලැබීමයි.
(3) C කඩදාසියේ තැඹිලි පැහැයක් දක්නට ලැබීමයි


**52.** සමාන ප්‍රමාණ වලින් ජලය පුරවන ලද සමාන භාජන තුනකට ප්‍රමාණයෙන් සමාන A,B හා C ලී කුට්ටි තුනක් දැමූ විට පෙනෙන ආකාරය පහත රූපසටහනේ දක්වා ඇත.




ඒ අනුව ඒවායින් බරෙන් වැඩිම ලී කුට්ටිය කුමක් ද?

(1) A (2) B (3) C

**53.** කාන්දම් කැබලි දෙකක් ලං කර තැබීමේ දී ඒවා පිහිටිය හැකි ආකාරය දැක්වෙන රූපසටහන කුමක් ද?



(1) (2) (3)

**54.** ඩෙංගු රෝගය පිළිබඳ සකස් කරන ලද පෝස්ටරයක පහත සඳහන් වගන්තිය ලියා තිබුණි.
' ඩෙංගු රෝගය ඇති කරන්නෝ ද අපමයි' මෙය නිවැරදිව පැහැදිලි කරන වගන්තිය කුමක් ද?

(1) ගෙවත්තේ ජලය රැඳෙන තැන් පිරිසිදු නොකිරීම නිසා
(2) විවෘත ස්ථානවල ඇති ආහාර ද්‍රව්‍ය අනුභව කිරීම නිසා
(3) ඩෙංගු වැළඳුනු රෝගීන්ට උදවු උපකාර කරන නිසා

**55.** සැකසහිත දෙයක් දුටුවිට කළ යුතු වඩාත් ම සුදුසු ක්‍රියාව කුමක් ද?

(1) එම ස්ථානයෙන් ඉක්මනින් ඉවත් වීම
(2) එම ස්ථානයෙන් වහා ඉවත් වී වැඩිහිටියෙකු දැනුවත් කිරීම
(3) යහළුවන් සමඟ එය කුමක් දැයි සොයා බැලීම

**56.**

**57.** ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන සේවාවල දැකිය **නොහැකි** ලක්ෂණයක් වන්නේ,

(1) ගැහැණු, පිරිමි ලෙස ආසන වෙන්කර තිබීමයි.
(2) පූජ්‍ය පක්ෂය සඳහා ආසන වෙන්කර තිබීමයි.
(3) ගැබිණි මවුවරුන් සඳහා ආසන වෙන්කර තිබීමයි.

**58.** අනාගතයේ දී බලශක්තිය අඩු වී යන බැවින් ඒ සඳහා ගත හැකි විසඳුමක් වන්නේ,

(1) වාහනවලට ඉන්ධන වශයෙන් පෙට්‍රල් යොදා ගැනීමයි.
(2) සුළං බලය යොදා ගනිමින් විදුලිය නිපදවීමයි.
(3) දුම්රිය ධාවනය සඳහා ගල් අඟුරු යොදා ගැනීමයි.

**59.** ඔලිඳ කෙළිය ක්‍රීඩාව සිදු කරනු ලබන්නේ,

(1) පොළොව මත අඳින ලද කොටු දැලක් මතයි.
(2) සිදුරු කිහිපයකින් යුත් ලී පුවරුවක් මතයි.
(3) කඩදාසිය අඳින ලද කොටු දැලක් මතයි.

**60.** ''මා දුටු අසිරිමත් අහස'' පිළිබඳ විස්තර කෙරෙන වාක්‍ය **තුනක්** ලියන්න.
(සෑම වාක්‍යක් ම වචන පහකට නොඅඩු විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

1. ..........................................................................................................

..........................................................................................................

2. ..........................................................................................................

..........................................................................................................

3. ..........................................................................................................

..........................................................................................................

**පිළිතුරු සාකච්ඡාව pahana Online Thaksalawa youtube නාලිකාවෙන් නරඹන්න.**

**ආදරණීය දුවේ පුතේ,**
පහන තක්සලාව හා සම්භන්ධ වන ඔබට අපෙන් නොමිලේ හිමිවන දේවල්....

- පසුගිය ශිෂ්‍යත්ව විභාග ප්‍රශ්න පත්‍රවලට අදාළ pdf
- සියලු පාඩම් සටහන් අදාළ පින්තූර ද සමග
- පාඩමෙන් පාඩමට ඒකක පරීක්ෂණ
- ඔන්ලයින් විභාග
- සියලු ම විෂයන් සඳහා අනාවරණ පරීක්ෂණ
- ශිෂ්‍යත්ව සමරූපී ප්‍රශ්න පත්‍ර
- වාර විභාග ප්‍රශ්න පත්‍ර



- 2013 සිට 2024 දක්වා පසුගිය ශිෂ්‍යත්ව විභාග ගැටලු ඇතුළත් ප්‍රශ්න පත්‍ර (ගැටලු වෙන් වෙන් ව වර්ගීකරණය කර)
- යල් පැන ගිය ගණිත ගැටලු අතහැර දමමින් අලුතෙන් ම සකස් කරන ගණිත ගැටලු නිබන්ධන

**ඉතිං එන්න පහන හා සම්භන්ධ වෙන්න. නිවසේ සිට සුව පහසුව ඉගෙනීමේ කටයුතු කර ගෙන යන්න දැන් ඔබට පුළුවන්.**

## 2025 පහන ONLINE තක්සලාව කාල සටහන (2025 ජනවාරි 2 සිට පන්ති ආරම්භ වේ)

**1 ශ්‍රේණිය - ගණිතය, සිංහල, පරිසරය (සිද්ධාන්ත පන්තිය)**
සඳුදා සහ අඟහරුවාදා ප.ව 5.00-6.00

**2 ශ්‍රේණිය - ගණිතය, සිංහල, පරිසරය (සිද්ධාන්ත පන්තිය)**
බදාදා, බ්‍රහස්පතින්දා සහ ඉරිදා ප.ව 5.00-6.00

**3 ශ්‍රේණිය - ගණිතය, සිංහල, පරිසරය (සිද්ධාන්ත පන්තිය)**
සඳුදා, අඟහරුවාදා සහ බදාදා ප.ව 6.00-7.00

**3 ශ්‍රේණිය - ගණිත ගැටලු හා ප්‍රශ්න පත්‍ර (ශිෂ්‍යත්ව පන්තිය)**
බ්‍රහස්පතින්දා සහ ඉරිදා ප.ව 6.00-7.00

**4 ශ්‍රේණිය - ගණිතය, සිංහල, පරිසරය (සිද්ධාන්ත පන්තිය)**
සඳුදා සහ අඟහරුවාදා ප.ව 7.00-8.00

**4 ශ්‍රේණිය - ගණිත ගැටලු හා ප්‍රශ්න පත්‍ර (ශිෂ්‍යත්ව පන්තිය)**
බ්‍රහස්පතින්දා සහ ඉරිදා ප.ව 7.00-9.00

**5 ශ්‍රේණිය - ගණිතය, සිංහල, පරිසරය (සිද්ධාන්ත පන්තිය)**
සඳුදා, අඟහරුවාදා සහ බදාදා ප.ව 8.00-9.00

**5 ශ්‍රේණිය - ගණිත ගැටලු හා ප්‍රශ්න පත්‍ර (ශිෂ්‍යත්ව පන්තිය)**
බ්‍රහස්පතින්දා සහ ඉරිදා ප.ව 7.00-9.00

